# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1449 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 10/09/2024<br>පැය 0520 |

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - මීගමුව පොලිස් වසම.

2024.09.09 වන දින සවස් කාලයේ මීගමුව පොලිස් වසමේ මංකුලිය ප්‍රදේශයේ පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට මීගමුව පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වන මංකුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම දියණිය සමග ඇතිවූ ආරවුලකදී දියණියගේ ස්වාමිපුරුෂයාද ඊට සම්බන්ධ වී එය දුරදිග යාම හේතුවෙන් දියණියගේ ස්වාමිපුරුෂයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට පොලිසිය විසින් සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - තණමල්විල පොලිස් වසම.

2024.09.09 වන දින රාත්‍රී කාලයේ තණමල්විල පොලිස් වසමේ 21 කණුව ප්‍රදේශයේ පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට තණමල්විල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ පුතා විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවත්, ඔහු මානසික ආබාධයකින් පෙළෙන බවත් දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇති අතර වයස අවුරුදු 26ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. රන් භාණ්ඩ හා දේපල සොරකම් කල සැකකාරියක් හෙරොයින් සමග අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.09.09 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 200ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 40 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකාරිය සම්බන්ධයෙන් සිදුකල විමර්ශනයේදී, මෙම සැකකාරිය ගෘහ සේවිකාවක් වශයෙන් සේවයේ යෙදෙන බවට පුවත්පත් වල දැන්වීම් පලකර නිවෙස්වල ගෘහ සේවයට ගොස් එම නිවෙස් වල රන් භාණ්ඩ හා දේපල සොරකම් කර ඇති බවත් දෙහිවල, හොරණ හා මිරිහාන පොලිස් ස්ථාන වලට වාර්තා වී ඇති රන් භාණ්ඩ හා දේපල සොරකම් කිරීමේ අපරාධ කිහිපයකට අවශ්‍ය කර සිටි සැකකාරියක් බවටත් අනාවරණය වී ඇත.

සොරකම් කරන ලද රන් වළලු 02ක්, රන් මාල 02ක්, රන් පෙන්ඩන් 01ක් සොයාගෙන ඇති අතර ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.09.09 වන දින සවස් කාලයේදී, මට්ටක්කුලිය පොලිස් වසමේ කදිරාන වත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 23 මිලිග්‍රෑම් 730 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.09.09 වන දින උදෑසන කාලයේදී, ගල්කිස්ස පොලිස් වසමේ ජයසුමනාරාම හන්දිය ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.09.09 වන දින සවස් කාලයේදී, පැලියගොඩ පොලිස් වසමේ 90 වත්ත ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2024.09.09 වන දින රාත්‍රී කාලයේදී, ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කම්බිකොටුව ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 760 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාතර අපරාධ කොට්ඨාසය.**

2024.09.09 වන දින සවස් කාලයේදී, දික්වැල්ල පොලිස් වසමේ හිරිකැටිය ප්‍රදේශයේදී මාතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **සංචාර වීසා නොමැතිව රැඳී සිටි විදේශ ජාතිකයෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 200 ක් සමඟ** අත්අඩංගුවට ගෙන දික්වැල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන බ්‍රසීල ජාතිකයෙකි.**

දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.09.09 වන දින සවස් කාලයේදී, ගල්කිස්ස පොලිස් වසමේ ගුවන්තොටුපල හන්දිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.09.09 වන දින සවස් කාලයේදී, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී වැටලීමක් සිදුකර **කුෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. නීතිවිරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කලවාන පොලිස් ස්ථානය.**

2024.09.09 වන දින උදෑසන කාලයේදී කලවාන පොලිස් වසමේ වැද්දගල ප්‍රදේශයේදී කලවාන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 37 ක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1297 ( බැරල්07)ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන කලවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කලවාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2024.09.09 වන දින දහවල් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ වපුරනවෙල ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ** සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 33 වයස්වල පසුවන කොටියාගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - අම්බලන්තොට පොලිස් වසම**

2024.09.09 වන දින උදෑසන කාලයේ අම්බලන්තොට පොලිස් වසමේ කොග්ගල්ල ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වන අලියෙකු පහරදීම හේතුවෙන් මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත අම්බලන්තොට පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක්වූ කොග්ගල්ල, අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වන අලින් තිදෙනෙකු ගම්වැදී ගොවිතැන් විනාශ කිරීම හේතුවෙන් එම වන අලි පලවා හැරීමට යාමේදී මෙම වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අම්බලන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 14. සැකකටයුතු මරණයක් - කයිට්ස් පොලිස් වසම.

2024.09.09 වන දින උදෑසන කාලයේ කයිට්ස් පොලිස් වසමේ අල්ලපිඩ්ඩි ප්‍රදේශයේ පුද්ගලයෙකු හිසෙහි තුවාල සහිතව සැකකටයුතු ලෙස මියගොස් සිටින බවට කයිට්ස් පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ අල්ලපිඩ්ඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෘත දේහය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් කයිට්ස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.

2024.09.09 වන දින උදෑසන කාලයේ තලංගම පොලිස් වසමේ නව නුවර ප්‍රධාන මාර්ගයේ මැක්ඩොනල්ඩ් මංසන්ධිය අසලදී පැලවත්ත දෙස සිට පිටකොටුව දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වූ රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**